**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2014**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ **2014** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත **2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **107(5)** උපවගන්තිය සහ **18** වන වගන්තිය යටතේ පනවා ඇති 1980 අංක **01** දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154 (1)** ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා **1971** අංක **38** දරන මුදල් පනතේ 13 වගන්තියේ **(3)** සහ **(4)** උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව සම්පත් පාලනය කිරීමේ හැකියාව, අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලාඒම මත වත්කම් ලෙස ගතහැකි අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල පිහිටි රූඩ් 02 පර්චර්ස් 1.5 ක් වූ ඉඩමේ අයිතිය ආයතනය සතුව නොතිබුණද තක්සේරුකර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ආකෘතිය අනුව ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

නෝවීජියන් අරමුදලේ ආයෝජන ආදායම් ගිණුම්ගත කිරීම සම්බන්ධව නිශ්චිත ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ලැබූ ආයෝජන ආදායම් රු.1,359,621 ක් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය බැරකර තිබූ අතර රු.262,500 ක් නෝවීජියන් අරමුදලට බැර කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පසුගිය වර්ෂයේ රු.980,000 ක් වූ මූල්‍ය නොවන ගැලපීම් ද මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රු. 2,325 ක් වූ අදාල නොවන අරමුදල් ගලායාමක්ද සාවද්‍ය ලෙස සටහන් කර තිබුණි.

#### 2.2.4 නොසැසඳුනු පාලන ගිණුම්

නෝවීජියානු අරමුදල් ව්‍යාපෘතිය යටතේ මිලට ගෙන තිබූ ස්ථාවර වත්කම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.18,707,876 ක් වූ අතර ආයතනයේ වාර්තා අනුව එය රු.19,359,465 ක් වූයෙන් රු.651,589 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ලබාගත් සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ගිවිසුම් ප්‍රකාරව රඳවාගත් මුදල් නිදහස් කිරීමෙන් තොරව රු.109,239 ක මුදල් වසර 02 සිට වසර 06 දක්වා කාල පරාසයක් රඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හා රාජ්‍ය බැංකුවකින් ලැබිය යුතු රු.8,405,718 ක මුදලක් වසර 02 ක සිට වසර 06 ක් දක්වා කාලයක් අයනොවී පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ආයතනය විසින් සේවකයන් සඳහා ලබාදුන් ණය මුදල් ඔවුන් විශ්‍රාම යාමට පෙර අයකරගත යුතු වුවත් සේවකයන් දෙදෙනෙකුගෙන් ලැබිය යුතු රු.7,514 ක මුදල 2008 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය | |
| (i) | X පරිච්ඡේදයේ 1.6 හා XX පරිච්ඡේදයේ 3.3, 3.5 වගන්ති | පරිපාලන ලේඛන නඩත්තු කළ යුතු වුවත් පේරාදෙනිය ප්‍රාදේශීය පුස්තකාලයේ පැමිණීමේ හා නිවාඩු ලේඛන, බැහැරයාමේ ලේඛන ක්‍රමවත් ලෙස පවත්වා නොතිබුණු අතර නිවාඩු ලබාගැනීමේදී පොදු 125 ආකෘති පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියළුම නිලධාරීන් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් ලේඛනයේ සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 7 දෙනෙකුගේ පැමිණීම පිටවීම සටහන් කිරීමකින් තොරව එකතුව රු.8,284,331ක වැටුප් සහ දීමනා ගෙවා තිබුණි. |
| (iii) | **X** වන පරිච්ඡේදයේ **ii** වන කොටසේ 27.4 | විදේශ අධ්‍යයන නිවාඩු අනුමත කරගත යුතු වුවත් 2013 අගෝස්තු 15 දින සිට 2014 අගෝස්තු 14 දක්වා කාලසීමාව සඳහා ලබාගත් විදේශ අධ්‍යයන නිවාඩු 2015 මැයි 20 වන දින වන විටත් අනුමත කරගෙන නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 394 (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.453,541 ක් වූ අවලංගු කරන ලද චෙක්පත් 649 ආදායමට ගෙන නොතිබූ අතර එම ශේෂය ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර තිබුණි. |
| (ඇ) | 2002 පෙබරවාරි 19 දිනැති අංක පීඊඩී/ 33 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව රු.95,883,688 ක් ආයෝජනය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, **2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,945,485 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,331,319 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,276,804 කින් පිරිහීම සඳහා පුනරාවර්තන වියදම් රු.23,326,529 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබා දී තිබූ රු.7,168,536 ක අරමුදලින් රු.4,982,803 ක් වැය කර නොතිබුණු අතර එය සියයට 69 ක අරමුදල් ඉතිරියක් වූයෙන් එම අරමුදල් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදවා නොතිබුණි.

(ආ) ආයතනයේ සංවර්ධන අරමුදලේ රු.260,563 ක ශේෂය වසර 07 කට වැඩි කාලයක් හා පර්යේෂණ හා ප්‍රකාශන අරමුදලේ රු.4,000,000 ක ශේෂය 2013 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2015 මැයි 15 වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පේරාදෙණිය ප්‍රාදේශීය පුස්තකාලයේ ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පරිගණක මධ්‍යම සැකසුම් ඒකක 02 ක් (CPU 02), මොනිටර් 03 ක් සහ ස්කැනර් යන්ත්‍රයක් මාස 15ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

### 4.2 පුස්තකාල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පේරාදෙණිය ප්‍රාදේශීය පුස්තකාලයේ සාමාජිකත්වය ලැබූ වෛද්‍යවරුන්ට පොත් බැහැර ගෙන යාම සඳහා දිනයක කාලයක් ලබාදී තිබුණද එකතුව රු.236,988 ක් වටිනා පොත් 11 ක් මාස 01 සිට මාස 14 දක්වා කාල පරාසයක් තුළ ආපසු භාර නොදී පැවති බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) නියැදි පරීක්ෂාවට අනුව වෛද්‍යවරුන් විසින් රු.7,500 ක තැන්පතුවකට යටත්ව සති 02 ක කාලසීමාවකට බැහැර ගෙන යන ලද රු.325,751 ක් වටිනා පොත් 13 ක් විගණිත දිනය වූ 2015 මාර්තු 02 වන දින වන විටත් ආපසු භාරදී නොතිබූ අතර ප්‍රමාද කාලය සති 15 සිට සති 116 දක්වා වන බව නිරීක්ෂණය විය.

**4.3 හඳුනාගත් පාඩු**

පේරාදෙණිය ප්‍රාදේශීය පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබුණු වටිනාකම හඳුනා නොගත් පොත් 03 ක් හා වටිනාකම රු.49,894 ක් වූ පොතක් අස්ථානගතවී තිබුණි.

**4.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ආයතනය විසින් කාර්යය පැවරුම් පදනම මත බඳවාගෙන සේවයේ යොදවා සිටි නිලධාරීන් 10 දෙනෙකු වෙනුවෙන් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් නොගෙවීම නිසා සේවකයාගේ දායකත්වය රු.506,795 ක් සහ අධිභාර රු.748,763 ක්ද සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ අධිභාර රු.506,795 ක්ද වශයෙන් එකතුව රු.1,762,353 ක් ආයතනයේ අරමුදලින් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් පශ්චාත් උපාධි පාඨමාලා 65 ක් මෙහෙයවාතිබූ අතර සමාලෝචිත වර්ෂයේ පමණක් රු.146,490,708 ක ආදායමක් උපයා ඇති අතර ඒ ඒ පාඨමාලා සඳහා වූ ආදායම් හා වියදම් සැලකිල්ලට ගෙන කාර්යසාධනය ඇගැයීමට සුදුසු පිරිවැය ගිණුම්කරණ ක්‍රමයක් හඳුන්වාදීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අයවැය ලේඛනය පිළියෙල කර ඊට අදාළ අනුමැතිය ලබාගත යුතු වුවත් විගණනයේදී පරීක්ෂා කළ පාඨමාලා 22ක නියැදියෙන් පාඨමාලා 11 ක අයවැය ලේඛන පිළියෙල කර නොතිබූ අතර පිළියෙල කරන ලද පාඨමාලා 10 ක අයවැය ලේඛන සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) තොග පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) පුස්තකාල පරිපාලනය
(ඈ) මූල්‍ය පාලනය